**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

උපදේශක චක්‍රලේඛය 2004/පුස/02 (අ)(සංශෝධිත 2026)

**පළාත් පාලන ආයතනවලට සම්බන්ධ මහජන පුස්තකාලයන්හි**
**"ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2026 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ** වැඩසටහන් සහ **විශේෂ** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන මෙන් සියලුම මහජන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ." දිවි ඇතිතුරු- අකුරු මිතුරු" යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. කියවීම

"කියවීම" යන්නෙන් හැඟී යන පොදු වාච්‍යාර්ථය ලෙස පොත්පත් කියවීම සැලකේ. නමුත් කියවීම යනු එයට වඩා පුළුල් අර්ථකථනයක් ලබාදිය හැකි ක්‍රියාවලියකි. ඒ යටතට තොරතුරු අවශ්‍යතා, දැනුම, රසවින්දනය,පර්යේෂණ කාර්යයන් සඳහා පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍ය හරහා කියවීම මෙන්ම මාර්ගගත, විද්‍යුත්, ශ්‍රව්‍ය දෘශ්‍ය යන මාධ්‍ය හරහා කියවීම ද ගැනේ. විවෘත මනසකින් නාට්‍යයක් රසවිඳීම, සොබාදහම විඳීම නිරීක්ෂණය ද එක්තරා කියවීමකි. කියවීම තුළින් දැනුමෙන් මෙන්ම පරිකල්පන ශක්තියෙන් නිර්මාණශීලීභාවයෙන්, විචක්ෂණශීලීත්වයෙන්, සංවේදීතාවයෙන් ,රසඥතාවයෙන් යුත් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සමාජයක් බිහිවීම සඳහා ලැබෙනුයේ විශාල පිටුබලයකි.

දැනට දශක කිපයක සිට තනි පුද්ගලයෙකු වශයෙන් මෙන්ම සමාජයක් වශයෙන්ද කියවීමේ පුරුද්ද දුරස්ථ වෙමින් පවතී. පුද්ගල ජීවිතයට කුමන හෝ අංශයෙන් වටිනාකමක් එක්කෙරෙන යහපත් වූ කියවීම වෙනුවට නූතන සන්නිවේදන තාක්ෂණය හරහා සිදු කෙරෙන ජනප්‍රිය රැල්ලේ ක්ෂණික මතුපිට කියවීම් වෙත නැඹුරුවීම මෙන්ම ඇබ්බැහිවීමද අද වන විට සමාජ ප්‍රගමනයට අහිතකර බලපෑම් එල්ල කර තිබේ. රටක් වශයෙන් පූර්ණ සංවර්ධනය කරා යන ගමනේදී දැනුම කේන්ද්‍රීය,සබුද්ධික,සංස්කෘතික සමාජයක් ගොඩ නැංවීම සඳහා කියවීම ඵලදායී හා අර්ථාන්විතව යොදා ගැනීම ඉතා වැදගත්ය.

## 03. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා විවිධ අංශ නියෝජනය වන පරිදි ජාතික කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම වඩා සුදුසු වේ. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මගින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත්කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- නාගරික ලේකම් හෝ පළාත්පාලන ආයතනයේ ලේකම් - උප සභාපති
- පුස්තකාලයාධිපති - කමටු ලේකම්

- ප්‍රජා සංවර්ධන නිලධාරී
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී
- පළාත් පාලන බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරික්ෂක
- පාඨක සමාජයේ ක්‍රියාකාරී නියෝජිතයෙක්
- ආසන්න පාසලක විදුහල්පති

## 04. ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

පුස්තකාලයක ප්‍රධාන කාර්යභාරය වන්නේ කියවීම හා සම්බන්ධ සේවා සාර්ථකව පවත්වාගෙනයාම වේ. ඒ යටතේ පුස්තකාලයක් විසින් ඉටුකරනු ලබන දෛනික කාර්යයන්ට සමගාමීව හා අමතරව පහත දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම,ප්‍රවර්ධනය කිරීම යෝජනා කෙරේ.

- කියවීම සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම.
- පුස්තකාල මුහුණු පොත (Facebook) ඔස්සේ විවිධ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරය හා ප්‍රසිද්ධිය ලබාදීම.
- පුස්තකාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය මගින් අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය හරහා පාඨක නිර්මාණ එළිදැක්වීමේ සංසද පිහිටුවීම.
- ළමයින්, විශේෂ අවශ්‍යතා සහිත පිරිස් වෙනුවෙන් කියවීම් වැඩසටහන් ක්‍රියාවට නැංවීම. ළමා නිවාස, වැඩිහිටි නිවාස, බන්ධනාගාර ආශ්‍රිතව ජංගම පුස්තකාල වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රවීණ සාහිත්‍යවේදීන්ගේ, විද්වතුන්ගේ/ විවිධ ක්ෂේත්‍රවලින් සාර්ථකත්වය ලැබූවන්ගේ කියවීම පිළිබඳ අදහස් සමාජ මාධ්‍ය ,විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කරවීම.
- අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් නිවැරදි තොරතුරු ගවේෂණය සම්බන්ධව පාඨකයා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම
- බල ප්‍රදේශයේ සෑම නිවසක් ආශ්‍රිතවම ගෘහස්ත පුස්තකාල ආරම්භ කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පුස්තකාලය හා මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම.
- තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කිරීම.
- අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් හරහා කියවීම ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රජාවගේ රසවින්දනය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රජා කණ්ඩායම් සඳහා කතන්දර ඉදිරිපත් කිරීමේ (Story Telling) වැඩසටහන් සංවිධානය කිරීම.සම්පත් දායකයින් ලෙස නිර්මාණශීලී ඉදිරිපත් කරන්නන් සහභාගී කරවා ගැනීම.
- සාහිත්‍ය සම්මානලාභී කෘති ඇසුරින් තෝරා ගත් කෘති අළලා විවෘත රසවින්දන විචාර තරඟ/විවෘත චිත්‍ර තරඟ සංවිධාන කිරීම.
- "පොතකට වේලාවක්" පොතක් කියවීමට පාඨකයාට නියමිත දිනයක් සහ වේලාවක් ලබාදීමේ වැඩසටහන් සංවිධානය කිරීම. එය පාසල් මට්ටමින් හෝ පාඨක සමාජ හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- කියවීම් කඳවුරු පැවැත්වීම.
- "කියවමු - දිනමු" තේමාව යටතේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
- කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා විශ්ව විද්‍යාල සිසුන් සම්බන්ධ කර ගැනීම.
- අදාළ බල ප්‍රදේශයේ හොඳම පාඨකයා තේරීමේ වැඩසටහන් / තරඟ සංවිධානය.
- පාඨකයන්ගේ නිර්මාණශීලී අදහස් පුස්තකාල බිත්ති පුවත්පත/සඟරා මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.
- පෙර වර්ෂවලට සාපේක්ෂව එදිනෙදා පුස්තකාල පරිහරණය ඉහළ නැංවීම.
- කියවීම / කියවීම ප්‍රවර්ධනය සම්බන්ධ කෙටි චිත්‍රපටි සකස් කිරීම
- TikTok මාධ්‍ය භාවිතාකර කියවීම ප්‍රවර්ධනය සඳහා වන විඩියෝ සකස් කිරීම.

- කියවීම සම්බන්ධ වැඩසටහන් තිරසර සංවර්ධන ඉලක්ක අනුව සිදු කිරීමට උත්සාහ කිරීම. (ස්ත්‍රී පුරුෂ,විවිධ ජාතීන්,විවිධ වයස් කාණ්ඩ)
- පුස්තකාලය විසින් සිදු කරන වැඩසටහන් සම්බන්ධයෙන් මාධ්‍ය හරහා ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.(පුවත්පත්,ප්‍රාදේශිය ගුවන්විදුලි *සේවාඇතුළු වෙනත් මාධ්‍ය හරහා)*
- වෙනත් නිර්මාණශීලී කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.
- වෙනත් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 05. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම සිදු කිරීම අවශ්‍ය නොවේ. අරමුදල් සපයා ගැනීම අදාළ පළාත් පාලන ආයතනය මඟින් හෝ පුස්තකාලය මඟින් සිදු කළ හැකිය.

## 06. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් සකස් කර අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2027 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර *අංශ ප්‍රධාන,* ***ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත,කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. මුළු ලකුණුවලින් 75% ක් පුස්තකාලය විසින් සිදු කරන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ද වෙනත් ප්‍රජා වැඩසටහන් සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් ද හිමිවේ.

වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක / සංඛ්‍යාදත්ත සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.**

## 07. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2026 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2027 ජාතික කියවීමේ මාසය සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ. ඇගයීම් කටයුතු පුස්තකාල මට්ටමින් සිදුකරන බැවින් එක් එක් පළාත් පාලන ආයතන සතු මහජන පුස්තකාල හා ශාඛා පුස්තකාල වෙන් වෙන් වශයෙන් වාර්තා එවිය යුතුය. ජයග්‍රාහී පුස්තකාල හා ඇගයීම් ලබන පුස්තකාල පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති


විමසීම් - දුරකථන අංකය - 0112-688855
ෆැක්ස් - 0112-685201
විද්‍යුත් තැපැල - libdev@mail.natlib.lk
වෙබ් පිටුව - www.natlib.lk